# පාලි අටුවා සම්පාදනයට මූලාශ්‍රය වූ හෙළ අටුවා සාහිත්‍යය පිළිබඳ විමසුමක්

**- ආධුනික කථිකාචාර්ය විල්ගමුවේ පියනන්ද හිමි**

බුදුන් වහන්සේ විසින් දේශිත ධර්ම විනය පැහැදිලි කරගැනීම සඳහා ලියවී ඇති අර්ථ ව්‍යාඛ්‍යාන හෙවත් අටුවා 'අට්ඨකථා සාහිත්‍යය' ලෙස හැඳින්වේ. බුදුන් වහන්සේ විසින් ම ඒ ඒ ස්ථානවල දී දේශිත ප්‍රකීර්ණක දේශනාව වන ගැඹුරු දහම් කොටස් විස්තර කරන දේශනා අර්ථ කථන සාහිත්‍යයේ ආරම්භය යි. සාරිපුත්ත, මහාකච්චායන, මහාකොට්ඨිත වැනි තෙරවරුන් විසින් බුදුන් වහන්සේ කෙටියෙන් දේශනා කළ ධම්මදායාද, මධුපිණ්ඩික වැනි සූත්‍ර විස්තර විවරණ කොට දේශනා කරන ලදී. එම තෙරවරුන් 'ධම්ම කථික' යන විශේෂ නාමය ලද්දේ අර්ථ ව්‍යාඛ්‍යාන ක්‍රමයෙන් දහම් දෙසූ හෙයිනි. එසේ ම එහි අග්‍රස්ථානය ලබා සිටියේ මහාකච්චායන මහරහතන් වහන්සේ ය.[1]

ත්‍රිපිටකය පුරාවට ම අටුවා ලක්ෂණ පෙන්නුම් කරන අවස්ථා එමට ය. ඒ බව මජ්ඣිමනිකායේ සහ දීඝනිකායේ ඇතුළත් සතිපට්ඨාන සූත්‍ර විමසා බැලීමෙන් පෙනීයයි. මජ්ඣිමනිකායේ සඳහන් සතිපට්ඨාන සූත්‍රය කෙටි දේශනාවක් වන අතර දීඝනිකායේ සඳහන් සතිපට්ඨාන සූත්‍රය විස්තරාත්මකව දහම් කරුණු විභජනය කොට දේශනා කරන ලද්දකි. එසේ ම පෙළ ග්‍රන්ථ සම්පාදනයේ දී ද ඇතැම් ග්‍රන්ථ අටුවා ස්වරූපය ගෙන ඇති බව කිව යුතු ය. සුත්තනිපාතයේ අට්ඨක වග්ගයේ ගාථා විවරණය කිරීම සඳහා සම්පාදනය කරන ලද මහානිද්දේසයේත්, එහි පාරායන වග්ගයේ එන ගාථා විස්තර කිරීම පිණිස සම්පාදිත



චුල්ල නිද්දේසයේත් ගාථාවක් විවරණය කිරීමේ දී එහි පදවලට සමාන අර්ථ, පද, ව්‍යාකරණ ආදි අටුවාවක මූලික ලක්ෂණ අන්තර්ගතය. එසේම කථාවත්ථුප්පකරණය, නෙත්තිප්පකරණය, පේටකෝපදේසය, ආදී ග්‍රන්ථ ද අටුවා ලක්ෂණයෙන් යුක්ත වේ.

"න හි භගවා අබ්‍යාකතං නාම තන්තිපදං අත්ථි, සබ්බෙසං යෙව අත්ථො කථිතො තස්මා සම්මාසම්බුද්ධෙන තිණ්ණං පිටකානං අත්ථවණ්ණනාක්කමොපි භාසිතො'ති දට්ඨබ්බං තත්ථ තත්ථ භගවතා පවත්තිතා පකිණ්ණක දෙසනායෙව අට්ඨකථා"[2]

යනුවෙන් දක්වා ඇති පරිදි බුදුන් වහන්සේ විසින් දේශිත ප්‍රකීර්ණක දේශනාව අට්ඨකථා ලෙස පිළිගැනෙන බැවින් පෙළ මෙන් ම අටුවාවත් බුදුන්වහන්සේගේ ම දේශනාවක් බව ථෙරවාදි මතය යි. සුමංගල විලාසනියේ ආරම්භයේ එන ගථාවන්ගෙන් අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමි දක්වන්නේ මීට සමාන ම අදහසකි.

"අත්ථප්පකාසනත්ථං - අට්ඨකථා ආදිතො වසිසතෙහි
පංචහි යා සංගීතා - අනුසංගීතා ච පච්ඡා'පි

සීහලදීපං පන ආභතාථ - වසිනා මහාමහින්දෙන
ඨපිතා සීහල භාසාය - දීපවාසීනමත්ථාය"[3]

බුද්ධ කාලයේ පටන් පැවති අටුවා පළමු සංගායනාවේ දී ද දෙවන හා තෙවන සංගායනාවල දී ද රහතන් වහන්සේලා විසින් පිළිවෙළින් සංගායනා කරන ලද අතර එම අටුවා සහිත වූ දේශනා පාලිය සම්බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් තුනකට පසු මහින්ද මහරහතන් වහන්සේ විසින් ලක්දිවට ගෙන එන ලදුව උන්වහන්සේ ප්‍රමුඛ මහා විහාරීය ශ්‍රී ලාංකේය තෙරවරුන් විසින් හෙළ බසට නගන ලද බවත් පසුව ඒවා ලේඛනගත කරන ලද බවත් එහි දැක්වේ. එසේ හෙළ බසින් ලේඛනගත කරන ලද අටුවා සාහිත්‍යය වන්නේ සීහළට්ඨකථා සාහිත්‍යය යි.

"මගධබසින් වැටෙමින් ආ බුදුකැලි අටුවා හෙළදිව ඇජුරො හෙළුබසින් තැබූහ."[4]

ධම්පියා අටුවා ගැටපදයේ සඳහන් එම ප්‍රකාශයෙන් මිහිඳු මහරහතන් වහන්සේගේ උපදේශකත්වය යටතේ ශ්‍රී ලාඞ්කේය මහතෙරවරුන් විසින් සිංහල භාෂාවෙන් රචිත බව ම කියවේ. එම අටුවා සහිත වූ අතිවිශාල කෘති ප්‍රමාණය එක්තැන් කළ විට මධ්‍යයම ප්‍රමාණයෙහි ඇතුන් සත් දෙනෙකුගේ උසට සමාන බව බුද්ධඝෝසුප්පත්ති කෘතියෙහි සඳහන් ය.[5]

මේ වන විට හෙළටුවා ග්‍රන්ථ සියල්ල ම අවිද්‍යමානය. එබැවින් එම ග්‍රන්ථයන් පිළිබඳව කරුණු සෙවීමට සිදු වී ඇත්තේ ක්‍රි.ව. 05 වන සියවසේ මෙරටට පැමිණි බුද්ධඝෝෂ හිමියන් ආරම්භ කරන ලද ධම්මපාල, බුද්ධදත්ත සහ මහානාම ආදී අටුවාචාර්යන් වහන්සේලා විසින් ඉදිරියට ගෙන යන ලද පාලි අට්ඨකථා සාහිත්‍යයෙහි මූලාශ්‍රය ග්‍රන්ථයන් පිළිබඳ දැක්වෙන සංඥා නාමයන්ගෙන් හා අන්තර්ගත කරුණු පිරික්සීමෙන්ය. එසේම තත් විෂයෙහි උගතුන් විසින් රචනා කොට ඇති පර්යේෂණ ග්‍රන්ථ ද ඒ සඳහා ප්‍රයෝජනවත් වේ. මෙහි දී පාලි අටුවාචාරීන් වහන්සේලා විසින් රචිත දැනට විද්‍යමාන පාලි අටුවා සාහිත්‍යය කෙරෙහි කෙටියෙන් වුව ද පළමුව අපගේ අවධානය යොමු කළ යුතු වෙයි.

| පෙළ | අටුවා | අටුවාචාරීහු |
| --- | --- | --- |
| | විසුද්ධිමග්ගය | බුද්ධඝොෂ හිමි |
| විනය පිටකය | සමන්තපාසාදිකාව | බුද්ධඝොෂ හිමි |
| පාතිමොක්ඛ | කඞ්ඛාවිතරණී | එම |
| **සුත්ත** | | |
| දීඝනිකාය | සුමඞ්ගලවිලාසිනී | බුද්ධඝොෂ හිමි |
| මජ්ඣිමනිකාය | පපඤ්චසූදනී | එම |
| සංයුත්තනිකාය | සාරත්ථප්පකාසිනී | එම |
| අංගුත්තරනිකාය | මනොරථපූරණී | එම |
| **ඛුද්දකනිකාය** | | |
| 01. ඛුද්දක පාඨ | පරමත්ථජොතිකා | බුද්ධඝොෂ හිමි? |
| 02. ධම්මපද | ධම්මපදට්ඨකථා | එම? |
| 03. උදාන | පරමත්ථදීපනී | ධම්මපාල හිමි |
| 04. ඉතිවුත්තක | පරමත්ථදීපනී | එම |
| 05. සුත්තනිපාත | පරමත්ථජොතිකා | බුද්ධඝොෂ හිමි? |
| 06. විමානවත්ථු | පරමත්ථදීපනී | ධම්මපාල හිමි |
| 07. පෙතවත්ථු | පරමත්ථදීපනී | එම |
| 08. ථෙරගාථා | පරමත්ථදීපනී | එම |
| 09. ථෙරිගාථා | පරමත්ථදීපනී | එම |
| 10. ජාතක | ජාතක අට්ඨකථා | බුද්ධඝොෂ හිමි |
| 11. නිද්දේස | සද්ධම්මපජ්ජොතිකා | උපසෙන හිමි |
| 12. පටිසම්භිදාමග්ග | සද්ධම්මප්පකාසිනී | මහානාම හිමි |
| 13. අපදාන | විසුද්ධජනවිලාසිනී | අඥාතයි |
| 14. බුද්ධවංස | මධුරත්ථවිලාසිනී | බුද්ධදත්ත හිමි |
| 15. චරියාපිටක | පරමත්ථදීපනී | ධම්මපාල හිමි |
| **අභිධම්ම** | | |
| ධම්මසංගනී | අත්ථසාලිනී | බුද්ධඝොෂ හිමි |
| විභඞ්ග | සම්මොහවිනොදනී | එම |
| කථාවත්ථු | | |
| පුග්ගලපඤ්ඤත්ති | | |
| ධාතුකථා | පඤ්චප්පකරණට්ඨකථා | එම |
| යමක | | |
| පට්ඨාන | | |



ථෙරවාදී ත්‍රිපිටකය සඳහා රචිත මෙම පාලි අටුවා ග්‍රන්ථ සියල්ල ම රචනා කිරීමේ දී ප්‍රධාන මූලාශ්‍රය ලෙස භාවිත කොට ඇත්තේ සීහලට්ඨකථා සහිත්‍යයයි. ඉහත සඳහන් පාලි අටුවා සටහනෙන් අඩකටත් වැඩි ප්‍රමාණයක් රචනා කරන ලද්දේ අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමියන් විසින් ය. උන්වහන්සේගේ පැමිණීමත්, කාර්යයත් වී ඇත්තේ ම සීහළට්ඨකථාවන් පාලියට පරිවර්තනය කිරීම බව මහාවංසයෙහි සඳහන් වේ.[6] ඉතිහාස ග්‍රන්ථයන්හි එසේ සඳහන් වුවත් පාලි අට්ඨකථාවන් හුදෙක් සීහළට්ඨකථාවන්ගේ පරිවර්තනයක් ම නොවන බව උන්වහන්සේ විසින් ම "ආරොපයිත්වාන"[7] "සංවණ්ණනං"[8] යන වචනයන්ගෙන් සිදුකිරීමට යන කාර්ය ඒ ඒ අට්ඨකථාවන්ගේ ආරම්භයේ ම

දැක්වීමෙන් පැහැදිලි ය. මේ අනුව සීහළට්ඨකථාවන්හි හරය පමණක් ගෙන අනවශ්‍ය විස්තර බැහැර කොට නිරුක්ති, වචනාර්ථය, ව්‍යාකරණ ලක්ෂණ, වචන පිළිබඳ ආචාර්ය මත, නිදර්ශන කථා, ඓතිහාසික තොරතුරු ඇතුළත් කොට මහාවිහාර සම්ප්‍රදායන් නොඉක්මවමින් විධිමත් ව පාලි භාෂාවට නැගීම සිදුකොට ඇත. සීහළට්ඨකථා සාහිත්‍යය ලෙස ගැනෙන ග්‍රන්ථ සමූහයකි. එහිදී බුද්ධඝෝෂ හිමි ඇතුළු අටුවාචාරීන් වහන්සේලා තම අට්ඨකථාකරණයෙහි දි මූලාශ්‍රය කරගත් ග්‍රන්ථ, ව්‍යාඛ්‍යාන, ආචාර්ය මතවාද වශයෙන් ගෙනහැර දක්වන මූලාශ්‍රයයන් විසිඅටක් පිළිබඳ ඊ. ඩබ්ලිව් අදිකාරම් මහතා විසින් තම ග්‍රන්ථයෙහි දක්වා ඇත.

01. මහා අට්ඨකථා හෙවත් මූලට්ඨකථා
02. මහා පච්චරිය අට්ඨකථා
03. කුරුන්දි අට්ඨකථා
04. අන්ධකට්ඨකථා
05. සඞ්ඛෙපට්ඨකථා
06. විනයට්ඨකථා
07. සුත්තන්තට්ඨකථා
08. ආගමට්ඨකථා
09. දීඝට්ඨකථා
10. මජ්ඣිමට්ඨකථා
11. සංයුත්තරට්ඨකථා
12. අංගුත්තරට්ඨකථා
13. අභිධම්මට්ඨකථා
14. සීහලට්ඨකථා
15. අට්ඨකථා (එක වචනයෙන්)
16. අට්ඨකථා (බහු වචනයෙන්)
17. අට්ඨකථාචරියා
18. ආචරියා
19. ආචරියවාද
20. ආචරියමත
21. ථෙරසල්ලාප
22. පරසමුද්දවාසී ථෙරා
23. විතණ්ඩවාදී
24. පොරාණා
25. පොරාණකත්ථෙරා
26. පොරාණාචරියා
27. පොරාණට්ඨකථා
28. භාණකා[9]

ඉහත ග්‍රන්ථ නාමවලිය ම විද්වත්හු සීහළට්ඨකථා ලෙස නොපිළිගනිති. එයින්

01. මහාඅට්ඨකථාව හෙවත් මූලට්ඨකථා (මහා අටුවා)
02. මහාපච්චරිය අට්ඨකථා (මහා පසුරු අටුවාව)
03. කුරුන්දී අට්ඨකථා නොහොත් කුරුන්දි වෙල්ලී අට්ඨකථා
04. අන්ධකට්ඨකථා සහ



05. සංඛෙපට්ඨකථා යන ග්‍රන්ථ පහ ප්‍රධාන සීහළට්ඨකථා ග්‍රන්ථ ලෙස හැඳින්විය යුතු බව විද්වතුන්ගේ මතය යි.[10] මෙයින් ද හෙළටුවා ලෙස මහාඅට්ඨකථාව, මහාපච්චරිය අට්ඨකථාව සහ කුරුන්දි අට්ඨකථාව යන ග්‍රන්ථ තුන සියලු විද්වතුන් විසින් අවිවාදයෙන් පිළිගනු ලැබේ.[11] බුද්ධඝෝෂ හිමියන් විසින් සම්පාදිත සියලු අටුවාවන්ට ම පාහේ මෙම ග්‍රන්ථ තුන ප්‍රධාන මූලාශ්‍රය ලෙස ගෙන ඇති බව සමන්තපාසාදිකා විනයට්ඨකථාවේ ආරම්භයේ දැක්වෙන ගාථාවෙන් පැහැදිලිය.[12] සෙසු අටුවාවන්ට ද ප්‍රධාන මූලාශ්‍රය වූ මෙම ග්‍රන්ථයන් පමණට ම අප්‍රධාන වූ තවත් සීහලට්ඨකථාවන් තිබෙන්නට ඇති බව අදිකාරම් මහතා සඳහන් කරයි.[13] ඒවා අතුරින් ඇතැම් ග්‍රන්ථ නාමමාත්‍රිකව ද, ඇතැම් ග්‍රන්ථ එක ම ග්‍රන්ථය සඳහා යොදන ලද අපරනාමික ග්‍රන්ථ ලෙස ද පවතින්නට ඇත. එබැවින් එම ග්‍රන්ථ පිළිබඳ කරුණු දැක්වීමට ප්‍රමාණවත් සාධක නොමැති තරම් ය.[14]

සමන්තපාසාදිකාව නම් විනය අටුවාවේ සඳහන්[15] සියලු විද්වතුන් විසින් පිළිගන්නා ලද පාලි අටුවා සාහිත්‍යයට මූලාශ්‍රය කරගන්නා ලද සීහළට්ඨකථා සහිත්‍යය ලෙස ගැනෙන මහාඅට්ඨකථාව, මහාපච්චරිය අට්ඨකථාව සහ කුරුන්දි අට්ඨකථාව යන ග්‍රන්ථ තුනෙන් ද ප්‍රධාන මූලාශ්‍ර ග්‍රන්ථය ලෙස පිළිගනු ලබන්නේ මහාඅට්ඨකථාව යි. එබැවින් ම මෙය මූල අට්ඨකථා ලෙස හඳුන්වනු ලබයි. බුද්ධඝෝෂ හිමියන් විසින් සම්පාදිත සියලු ම අටුවාවන්ට මෙම ග්‍රන්ථය ප්‍රධාන මූලාශ්‍රය කරගෙන ඇති බැවින් මෙම අටුවාව තුන් පිටකය ම අලළා රචනා කරන ලද ග්‍රන්ථයක් ලෙස අදිකාරම් මහතා සඳහන් කරයි.[16] සමන්තපාසාදිකාවේ ප්‍රාරම්භක ගාථාවන්හි[17] ද සූත්‍ර පිටකයෙහි ප්‍රධාන අට්ඨකථා සතරෙහි නිගමන ගාථාවල ද අභිධම්ම අටුවාවක් වන අත්ථසාලිනියෙහි[18] ද මහාඅට්ඨකථාවෙන් උපුටාගන්නා ලද කරුණු සඳහන් වේ. එබැවින් අදිකාරම් මහතාගේ උක්ත නිගමනය සාධාරණය.

සෙසු හෙළටුවාවන්ට වඩා වස්තු විෂයෙන් පරිපූර්ණ ග්‍රන්ථයක් වන මෙම මහාඅට්ඨකථාව නිරන්තරයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ ගෞරවයට පාත්‍රවී ඇති ග්‍රන්ථයකි.[19] තමන් වහන්සේ

විසින් අර්ථ විවරණය කරන විට නිදසුන් සඳහා මහාඅට්ඨකථාවෙන් උපුටාගත් අදහස් ග්‍රන්ථ නාමයෙන් ම දක්වා ඇත්තේ එය වස්තු විෂයෙන් පරිපූර්ණ ග්‍රන්ථයක් නිසාවෙන් ය. ඒ සඳහා උදාහරණ වශයෙන් පරිවාරපාලි වර්ණනා කොටසේදී "දසචීවර" වදනට මහාඅට්ඨකතාවේ සඳහන් "මහාට්ඨකථායං නවසු කප්පිය චීවරෙසු"[20] යන අර්ථ විවරණය දැක්විය හැකිය. එබැවින් ම සමන්තපාසාදිකා විනයට්ඨකථාවේ පමණක් තිස්නව (39) වතාවක්[21] ද වංසත්ථප්පකාසිනියේ තිස්හය (36) වතාවක් මහාඅට්ඨකථා යන සංඥා නාමය දැක්වීමෙන් ද ධම්මපාල හිමියන් විසින් රචිත උදාන අටුවාවෙහි ද "මහාඅට්ඨකථායං වුත්තං"[22] යනුවෙන් දැක්වීමෙන් ද විසුද්ධිමග්ගයේ දි "අට්ඨකථායං" යන ඒකවචන රූපයෙන් මහාඅට්ඨකථාව අදහස් කරන්නට ඇති බැවින්[23] ද ප්‍රධාන මූලාශ්‍රය ග්‍රන්ථයක් ලෙස පාලි අටුවා කරණයට මෙම හෙළ අටුවාවේ වු වැදගත්කම දැක්විය හැකිය.

මෙම මහාඅට්ඨකථාව බුද්ධකාලීන භාරතීය ඉතිහාසය මෙන් ම ශ්‍රී ලාංකීය ඉතිහාසගත කථා පුවත් රසකින් සමන්විත අධික විස්තර වර්ණනාවන්ගෙන් යුක්ත වූවක් වන්නට ඇත. එසේම වටිනා ධර්මොපදේශයන්ගෙන් හෙබි කාණ්ඩ කිහිපයකින් ත්‍රිපිටකය ම අලළා රචිත බහු කතෘක කෘතියක් විය හැකිය. මෙනිසාම මහාවිහාර පරපුරේ ප්‍රශස්ත ම කෘතිය ලෙස මෙය සැලකා ඇති බව පෙනේ.

පසුරක සිට ලියූ බැවින් මහාපච්චරි අට්ඨකථාව යන නම් ලත්[24] මෙය පාලි අටුවා සාහිත්‍යයට මූලාශ්‍රය වූ මීළඟ වැදගත් හෙළටුවාව යි. සමන්තපාසාදිකාවේ සඳහන් සීහළට්ඨකථා තුනෙන් දෙවැනි තැන ගන්නා[25] මෙය විනය පිටකය සඳහා ම ලියන ලද කෘතියක් ලෙස හැඳින්විය හැකිය.[26] සමන්තපාසාදිකා අටුවාව රචනා කිරීම සඳහා මූලාශ්‍රය ලෙස මෙම හෙළටුවාව භාවිත කර ඇති අතර එහි අනූපස්වතාවක් (95) මහාපච්චරි යන ග්‍රන්ථ නාමයෙන් ද පච්චරි නමින් එක් වතාවක් ද සඳහන් වී ඇත.[27] "මහාපච්චරියාදිසු"[28] යනුවෙන් දැක්වීමෙන් විනය පිළිබඳ වෙනත් හෙළටුවාවන් තිබෙන්නට ඇති බැවින් ඒවා අතුරින් ප්‍රධාන ම හෙළටුවාව මෙය වන්නට ඇති බව අපට



සිතිය හැකිය. එසේ ම වෙනත් හෙළ අටුවාවන් සමඟ මෙහි අදහස් පිරික්සීමෙන් හා (මහාපච්චරියං පන සංඛෙපට්ඨකථායාසු, අට්ඨකථාසු,[29]) මහාඅට්ඨකථාවේ අදහස් සමඟ සසඳා දැක්වීමෙන් විනය පිළිබඳ අපැහැදිලි තොරතුරු බොහෝමයක් ද මෙහි තිබී ඇත. මහාඅට්ඨකථාවට වඩා විනය පිළිබඳ අර්ථ විවරණ දැක්වූ කෘතියක් ලෙස මහාපච්චරි අට්ඨකථාව පවතින්නට ඇත. එනිසාම බුද්ධඝෝෂ හිමියන් සමන්තපාසාදිකාව රචනා කරන කාලය වන විට ලාංකේය සමාජයේ විනය පිළිබඳ ප්‍රධාන කෘතියක් ලෙස මෙම අට්ඨකථාව පැවති බව බොහෝ වාර ගණනාවක් මෙම ග්‍රන්ථය මූලාශ්‍රයක් ලෙස සමන්තපාසාදිකාවෙහි ග්‍රන්ථනාමයෙන් ම දැක්වීමෙන් පැහැදිලි ය.

ලක්දිව කුරුන්දි වෙල්ලි නම් විහාරයේ දි ලියන ලද හෙයින් කුරින්දි අට්ඨකථා නම් වන මෙය[30] විනය පිටකය සඳහා සිංහලයෙන් ලියවුණ කෘතියකි. සමන්තපාසාදිකාව රචනා කිරීමේ දි තුන්වන ග්‍රන්ථය ලෙසත් විනය පිළිබඳ දෙවන ග්‍රන්ථය ලෙසත් මූලාශ්‍රය කොට ගෙන ඇත.[31] සමන්තපාසාදිකාවේ "කුරින්දට්ඨකථායං", "කුරින්දියං", "කුරින්දි ආදීසු"[32] යනාදි වශයෙන් මෙම හෙළටුවාව ගැන හැටහත්වතාවක් (67) ග්‍රන්ථය පුරා සඳහන් වේ.[33] විනය කරුණුවලින් මහාපච්චරි අට්ඨකථාවේත් සංඛෙප අට්ඨකථාවේත් අදහස්වලට සමාන අදහස් තිබූ ග්‍රන්ථයක් ලෙස "කුරින්දි ආදිසු" "කුරින්දිමහාපච්චරිආදිසු"[34] "කුරින්දි සංඛෙපට්ඨකථාසු" යනුවෙන් දැක්වීමෙන් ඒ බව පෙනීයයි.

අන්ධක භාෂාවෙන් හෙවත් ආන්ද්‍ර බසින් ලියවුණු ග්‍රන්ථයක් ලෙස සැලකෙන අන්ධකට්ඨකථාව ද සමන්තපාසාදිකාවේ සඳහන් තවත් මූලාශ්‍රය ග්‍රන්ථයකි. එම අටුවාවේ පැවති අදහස්වලට එකඟවීමට වඩා සදොස් තැන් පෙන්වීමට මෙම අටුවාව භාවිත කොට ඇති බව අදිකාරම් මහතාගේ අදහස යි.[35] "යම්පන අන්ධට්ඨකථායං ... තං අන්ධට්ඨක රට්ඨෙ...."[36] යන යෙදුම් සමන්තපාසාදිකාවේ භාවිත වන බැවින් ද මෙය සීහළට්ඨකථා ගණයෙහිලා නොසලකයි. එහෙත් බුද්ධඝෝෂ හිමියන් මූලාශ්‍රය ග්‍රන්ථයක් ලෙස භාවිත කොට ඇති බැවින්

මෙය මහාවිහාරයෙහි පැවති කෘතියක් නිසා සීහළට්ඨකථාවක් ලෙස සලකන්නට ඇතැයි යන්න අපගේ අදහසයි.

සංඛෙපට්ඨකථාව ද සමන්තපාසාදිකාව සඳහා මූලාශ්‍රය වූ ග්‍රන්ථයක් බව එම මූලාශ්‍රය පිළිබඳ දැක්වීමෙන් පැහැදිලි ය.[37] සංක්ෂිප්ත අටුවාව යන සිංහල අර්ථයට "සංඛෙපට්ඨකථා" යන පාලි රූපය යෙදෙන බැවින් අදිකාරම් මහතා පවසන්නේ මෙම අටුවාව මහාපච්චරියේ ම විනය පිළිබඳ වූ සංක්ෂිප්ත සංස්කරණයක් වන්නට ඇති බව යි.[38] ඉහත සඳහන් කළ මූලික සිහළට්ඨකථා තුන හැරුණු කොට අන්ධකට්ඨකථාව සහ සංඛෙපට්ඨකථාව පෙළ අටුවා සම්පාදනයේ දී මූලාශ්‍රය ග්‍රන්ථයන් ලෙස භාවිත කොට ඇත.

එසේ ම සූත්‍ර පිටකයේ දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තරනිකාය, සංයුත්තනිකාය යන ග්‍රන්ථ සතරටත් අභිධර්ම පිටකයේ ප්‍රකරණ ග්‍රන්ථ හතටත් ඛුද්දක ග්‍රන්ථ බොහෝමයකටත් වෙන් වෙන්ව අටුවා ග්‍රන්ථ තිබෙන්නට ඇත.[39] එම සියලු හෙළටුවා එක් වූ විට පාලි අට්ඨකථා සාහිත්‍යයට වඩා සීහලට්ඨකථා සාහිත්‍යය ග්‍රන්ථ ප්‍රමාණයෙන් විශාල වූ බව පෙනේ.

හෙළටුවාවන් රචිත භාෂාවේ ස්වරූපය පිළිබඳ කරුණු සෙවීමේ දී සීහළට්ඨකථා සාහිත්‍යය ග්‍රන්ථ වශයෙන් ශේෂව නැති බැවින් එම මූලාශ්‍රයයන්ගේ භාෂා ශෛලිය හෝ අර්ථකථන ශෛලිය පාලි අටුවාවන්ගෙන් පරිපූර්ණ වශයෙන් දැක්විය නොහැක. යක්කඩුවේ ප්‍රඥාරාම හිමියන් විසින් මජ්ඣිමනිකායේ පළමුවන කාණ්ඩයට ලියන ලද "සමන්නේසනා" ප්‍රස්තාවනාවේ ධම්පියා අටුවාගැටපදයෙහි සීහළට්ඨකථාවන්හි පැවති වාක්‍ය ඛණ්ඩ දෝෂ වර්ජිත කොට දක්වා ඇත. එම පාඨයන්ගෙන් තත්කාලීන භාෂාවේ ස්වරූපය පිළිබඳ යම් අවබෝධයක් ලබා ගත හැක. එබැවින් එම හෙළටුවා පාඨ එලෙසින් ම මෙහි දී දක්වන්නෙමු.



1. හෙළටුවායෙහි "අප්පමාදහි පණ්ඩිතහ ජෙනෙ" කියූහු. (ධඅගැ.79 පිට) (අර්ථයඃ හෙළටුවායෙහි "අප්‍රමාදයෙහි පණ්ඩිත වවූ ජනයා" යි කිහ.)

2. " යොගෙ වදානකි, උපද්දාවහි නහි" මහ අටුවාවෙහි කී බැවින් (79 පිට) (අර්ථයඃ යොග යන වචනය උපද්‍රවයට නම් වේ - යොග ශබ්දයේ උපද්‍රව යනුයි - යොග ශබ්දයේ අර්ථය උපද්‍රව යනුයි - මහ අටුවාවෙහි කී බැවින්.)

3. "සාමාවතියා වත්ථු නාම පඨමකි" යි මහ අටුවාහි ආ බැවින් (80පිට) (අර්ථයඃ සාමාවතියගේ වස්තුව පළමුවැන්න ය යි මහ අටුවාවේ ආ බැවින්.)

4. හෙළටුවායෙහි ..... "මාරස්ස පුප්ඵෙ වදානකි පුප්ඵ අකුසල" යි පුප්ඵ ශබ්දයෙන් අකුසල් කියහු (105 පිට) අර්ථයඃ හෙළටුවායෙහි "පුප්ඵ යනු මාරයාට යෙදෙන වචනයකි. පුප්ඵ නම් අකුසල" ය යි පුප්ඵ ශබ්දයෙන් අකුසල් කිහ.)

5. සාලිත්ථක සිප්පෙ, යත් හකුරු ලන සිප්හි, හෙළටුවායෙහි, යන්න "හක්කාරක ලනක සිපැයි" යෙත් (136 පිට) ................ හෙළටුවායෙහි " (යන්ත්‍රයෙන් ගල් කැට විදින ශිල්පය ය යි කියත්.)

6. "ලකුණ්ටකො වදානකි, රස්ස නැමි" යනු හෙළටුවායි (148 පිට) ( අර්ථයඃ ලකුණ්ටකො වචනය මිටි නම් අරුතෙහි වේ" යනු හෙළටුවා යි.)

7. "රහදො වදානකි, ආවාටහි නමි" හෙළු අටුවාවෙහි (148 පිට) (අර්ථයඃ රහදො වචනය ආවාට නම් අරුතෙහි වේ" ය යි හෙළටුවා යි.)[40]

මෙහි දැක්වෙන භාෂාව පාලි භාෂාවට ඉතා සමීප බසකි. ඒ බව අප්පමාද, උපද්දව, වත්ථු, පුප්ඵ, මාරස්ස, ආවාට, යන පදවලින් පැහැදිලි ය. එය ක්‍රිස්තු පූර්ව සියවස්වලට අයත් ලාඞ්කේය සෙල්ලිපිවල භාෂාවට සමානකමක් දක්වන ආදිතම

ප්‍රාකෘත ලක්‍ෂණයන්ගෙන් හෙබි සිංහල භාෂා ලක්‍ෂණයන්ගෙන් යුක්ත වෙයි. උපද්දාවහි, වදානකි, හක්කරක, ලනක යන පදවලින් එම ප්‍රාකෘත ලක්‍ෂණ පෙන්නුම් කරයි. මේ අනුව පාලි වචන ද උපයෝගි කරගනිමින් ප්‍රාකෘත බස්වහරෙන් මැනවින් සකස්කරගන්නා ලද සිංහල භාෂාවෙන් මෙම හෙළටුවාවන් රචනා කොට ඇත. එසේ ම මනා අර්ථ විවරණ ක්‍රමයක් ද තිබෙන්නට ඇති බව පාලි අටුවා වර්ණනා ක්‍රමවේදයන්ගෙන් සිතිය හැක.

මහාවිහාරයෙන් ඇරඹි සුවිශේෂී වූත් අතිවිශාල වූත් පළමු සාහිත්‍යය ක්‍රියාදාමය වන සීහළට්ඨකථා සාහිත්‍යය ක්‍රි.පූ. තෙවන සියවසේ දී ආරම්භව ක්‍රි.ව. පස්වන සියවසෙන් අවසන් වී ඇත. ඒ බුද්ධඝෝෂ හිමියන්ගේ ආගමනයත් සමඟ පාලි අටුවාවන්ට මුල්තැන ලබා දුන් බැවිනි. එහෙත් ක්‍රි.ව. 10 වැනි සියවසේ රචිත ධම්පියා අටුවා ගැටපදයෙහි හෙළටුවා පාඨ සඳහන් වීමෙන් 10 වන සියවස තෙක් සීහලට්ඨකථා සාහිත්‍යය මහාවිහාරයෙහි පවතින්නට ඇතැයි සිතිය හැක. එසේම සහස්සවත්‍ථුප්පකරණයට මෙන් ම මහාවංශ ටීකාවට ද හෙළටුවාවන් මූලාශ්‍රය කරගෙන ඇති බැවින් ක්‍රි.ව. 13 සියවස තෙක් අඩක් හෝ ආරක්‍ෂා වී තිබෙන්නට ඇත. පසුව සියවස් ගණනාවක් ගිය විට ක්‍රමයෙන් සීහළට්ඨකථා සාහිත්‍යය සම්පූර්ණයෙන් ම අභාවයට යන්නට ඇතැයි සිතිය හැකිය.

පෙළ අටුවා සාහිත්‍යයෙහි ප්‍රධාන වූ මූලාශ්‍රය වන සීහළට්ඨකථා සාහිත්‍යය එසේ අභාවයට යන්නට හේතු කිහිපයක් බලපාන්නට ඇත. ඒ අතර බුද්ධඝෝෂ, බුද්ධදත්ත, ධම්මපාල, ආදී අටුවාචාරීන් වහන්සේ විසින් සීහළට්ඨකථා සාහිත්‍යය මූලාශ්‍රය කොටගෙන විධිමත්ව පෙළ අටුවාවන් රචනා කිරිම. එම සාහිත්‍යය විශේෂය සඳහා මහාවිහාර භික්‍ෂූන් මුල්තැන දීම. එසේම පාලි අටුවාවන් සඳහා පමණක් අනාගත සඟ පරපුර උනන්දු කිරීම ආදි හේතූන් එයින් ප්‍රධාන වන්නට ඇත. ඒ හැරත් සිංහල භාෂාව යුගයෙන් යුගයට නව මුහුණුවරක් ගැනීම, නිකාය භේදයන් ඇතිවීම, රටට ඇතිවූ පරසතුරු ආක්‍රමණ හේතුවෙන් විශාල සාහිත්‍ය කොටසක් ආරක්‍ෂා කිරීමේ හා වැඩිදියුණු කිරීමේ



අපහසුතාව මහාවිහාරීය භික්‍ෂූන්ට ඇති වීම, දේශපාලන අනුග්‍රහය වරින් වර මහාවිහාරයට අහිමි වීම ආදී වූ හේතු සාධක සීහළට්ඨකථාවන්ගේ පරිහානිය සඳහා හේතුවන්නට ඇති බව අපගේ නිගමනය යි.

## ආන්තික සටහන්

1. අංගුත්තරනිකාය 1, බු.ජ.මු., ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, 1964, කොළඹ, 46 පිටුව.
   "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං සංඛිත්තෙන භාසිතස්ස විත්‍ථාරෙන අත්‍ථං විභජන්තානං යදිදං මහාකච්චායනො"
2. සාරත්‍ථදීපනි විනය ටීකා, සංස්. බි. දේවරක්ඛිත හිමි, ඩී.සී. වික්‍රමසිංහ ප්‍රකාශන, කොළඹ, 1914, 18 පිටුව.
3. සුමංගලවිලාසනී, ධම්මසංගනී අට්ඨකථා, හේවාවිතාරණ මුද්‍රණාලය, කොළඹ, 1918, 01 පිටුව.
4. ධම්පියා අටුවා ගැටපදය, සංස්. මැදඋයන්ගොඩ විමලකීර්ති හිමි, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1967, 06 පිටුව.
5. බුද්ධඝෝසුප්පත්ති, සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, 1960, 42 පිටුව.
6. මහාවංසො සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ගුණසේන මුද්‍රණාලය, කොළඹ, 1953, 37
   පරි.
   පාලි මත්තං ඉධානීතං නත්ථි අට්ඨකථා ඉධ
   තථාචරියවාදා ච භින්නරූපා න විජ්ජරේ
   සීහලට්ඨකථා සුද්ධා මහින්දෙන මතීමතා
   සංගීතිත්තයමාරූළ්හං සම්මාසම්බුද්ධදෙසිතං
   සාරිපුත්තාදිගීතඤ්ච කථාමග්ගං සමෙක්ඛිය
   එතා සීහළභාසාය සීහළෙසු පවත්තති
   තං තත්ථ ගන්ත්වා සුත්වා මාගධානං නිරුත්තියා
   පරිවත්තෙසි සා හොති සබ්බලොකහිතාවහා
7. ධම්මපදට්ඨකථා, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ,1919,01 පිටුව.
8. සමන්තපාසාදිකා විනයට්ඨකථා, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1926, 02 පිටුව.
9. අදිකාරම්, ඊ. ඩබ්ලිව්., පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2003, 41-42 පිටු

10. විජයවර්ධන, ජී.ඩී., හෙළටුවා, කොත්මලේ අමරවංශ හිමි, සිංහල සාහිත්‍යලතා, ගොඩගේ ප්‍රකාශනය, කොළඹ, 2000, 05 පිටුව.

11. එම

12. සමන්තපාසාදිකා විනයට්ඨකථා, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1926, 02 පිටුව.

13. අදිකාරම්, ඊ. ඩබ්ලිව්., පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2003, 42 පිටුව.

14. විජයවර්ධන, ජී.ඩී., හෙළටුවා, කොත්මලේ අමරවංශ හිමි, සිංහල සාහිත්‍යලතා, ගොඩගේ ප්‍රකාශනය, කොළඹ, 2000, 05 පිටුව.

15. සමන්තපාසාදිකා විනයට්ඨකථා, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1926, 02 පිටුව.

16. අදිකාරම්, ඊ. ඩබ්ලිව්., පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2003, 43 පිටුව.

17. සමන්තපාසාදිකා විනයට්ඨකථා, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1926, 02 පිටුව.

18. අට්ඨසාලිනී ධම්මසංගණිප්පකරණට්ඨකථා, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1940, 93 පිටුව.

19. අදිකාරම්, ඊ. ඩබ්ලිව්., පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2003, 44 පිටුව.

20. සමන්තපාසාදිකා විනයට්ඨකථා, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1926, 954 පිටුව.

21. චන්ද්‍රරතන හිමි, ලබුහේන්ගොඩ., පාළි අට්ඨකථා සාහිත්‍යය, සමයවර්ධන පොත්හල, කොළඹ, 2006, 43පිටුව.

22. පරමත්ථදීපනී උදානට්ඨකථා, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1920, 265 පිටුව.

23. අදිකාරම්, ඊ. ඩබ්ලිව්., පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2003, 49පිටුව.

24 එම, 45 පිටුව.

25. සමන්තපාසාදිකා විනයට්ඨකථා, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1926, 02 පිටුව.





26. කුලසූරිය, ආනන්ද., සිංහල සාහිත්‍යය 1, විසිදුණු ප්‍රකාශන, බොරලැස්ගමුව, 1999. 47 පිටුව.

27. චන්ද්‍රරතන හිමි, ලබුහේන්ගොඩ., පාළි අට්ඨකථා සාහිත්‍යය, සමයවර්ධන පොත්හල, කොළඹ, 2006, 43පිටුව.

28. සමන්තපාසාදිකා විනයට්ඨකථා, i, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1945, 229 පිටුව.

29. සමන්තපාසාදිකා විනයට්ඨකථා i, ii, iii, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1926,1945,1946,229,230,237 පිටු

30. ඊ. ඩබ්ලිව්. අදිකාරම්, පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2003, 45 පිටුව.

31. සමන්තපාසාදිකා විනයට්ඨකථා, i, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1926, 02 පිටුව.

32. සමන්තපාසාදිකා විනයට්ඨකථා, i, ii, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1926, 1945, 215, 226, 249,-388 පිටු.

33. චන්ද්‍රරතන හිමි, ලබුහේන්ගොඩ., පාළි අට්ඨකථා සාහිත්‍යය, සමයවර්ධන පොත්හල, කොළඹ, 2006, 44පිටුව.

34. සමන්තපාසාදිකා විනයට්ඨකථා, i, ii, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1926,1945, 814-5,824 පිටු.

35. අදිකාරම්, ඊ. ඩබ්ලිව්., පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2003, 46 පිටුව.

36. සමන්තපාසාදිකා විනයට්ඨකථා i, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1945, 466 පිටුව.

37. සමන්තපාසාදිකා විනයට්ඨකථා i, හේවාවිතාරණ මුද්‍රණය, කොළඹ, 1945, 224,229,353, පිටුව.

38. අදිකාරම්, ඊ. ඩබ්ලිව්., පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය, 2003, 47 පිටුව.

39. චන්ද්‍රරතන හිමි, ලබුහේන්ගොඩ., පාළි අට්ඨකථා සාහිත්‍යය, සමයවර්ධන පොත්හල, කොළඹ, 2006, 44පිටුව.

40. විජයවර්ධන, ජී.ඩී., හෙළටුවා, කොත්මලේ අමරවංශ හිමි, සිංහල සාහිත්‍යලතා, ගොඩගේ ප්‍රකාශනය, කොළඹ, 2000, 07 -08 පිටුව.